# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

### පාසල් පුස්තකාල පොත් අනුමත කිරීම

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනුයේ **මුද්‍රිත පිටපතක් නම් ඉන් පිටපත් 03 බැගින් ද අත්පිටපතක් නම් ඉන් පිටපත් 02 බැගින් ද** ඉදිරිපත් කළ යුතු වේ.

මේ සඳහා අය කරනු ලබන සමීක්ෂණ ගාස්තු පහත සඳහන් පරිදි වේ.

| | **පොත් වර්ගය** | **පොතේ ප්‍රමාණය** | **මුල් පිටු 100 සඳහා** | **පිටු 100 සිට වැඩිවන සෑම පිටුවකටම** |
|---|---|---|---|---|
| 1 | මුද්‍රිත සාමාන්‍ය පොත් (පිටු 49ට වැඩි) | ඩිමයි 1/8 හෝ ඊට වඩා විශාල (අඟල් 8.5 X 5.5 හෝ ඊට වඩා විශාල) | රු. 1500/- | රු. 15/- |
| 2 | මුද්‍රිත සාමාන්‍ය පොත් (පිටු 49ට වැඩි) | ඩිමයි 1/8 වඩා අඩු (අඟල් 8.5 X 5.5 වඩා අඩු) | රු. 1500/- | රු. 15/- |
| 3 | අත් පිටපත් (පිටු 49ට වැඩි) | A4 ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතුය. | රු. 1200/- | රු. 15/- |
| 4 | ළමා පොත් (පිටු 16ට වැඩි) | ක්‍රවුන් ¼ හෝ ඊට වඩා විශාල (අඟල් 9.5 X 7 හෝ ඊට වඩා විශාල) | රු. 1200/- | රු. 10/- |
| 5 | ළමා පොත් (පිටු 16ට වැඩි) | ක්‍රවුන් ¼ වඩා අඩු (අඟල් 9.5 X 7 වඩා අඩු) | රු. 1200/- | රු.10/- |
| 6 | ළමා (අත්පිටපත්) (පිටු 16ට වැඩි) | A4 ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතුය. | රු. 1200/- | රු. 10/- |
| 7 | සඟරා / ජර්නල් | A4 ප්‍රමාණය හෝ ඊට වැඩි විය යුතුය. | රු. 900/- | රු. 6/- |
| 8 | සඟරා / ජර්නල් | A4 ප්‍රමාණයට වඩා අඩු විය යුතුය. | රු. 900/- | රු. 6/- |
| 9 | මුද්‍රිත පුස්තිකා / අත්පිටපත් (පිටු 5-48 අතර) | අඟල් 8.5 X 5.5 වඩා අඩු | රු. 450/- | රු. 6/- |

මෙම සමීක්ෂණ ගාස්තු ගෙවීම අයදුම්පත්‍රයෙහි සඳහන් ආකාරයට මුදල් ඇණවුමක් (ගෙවන කාර්යාලය, ඉසුරුපාය) මගින් හෝ අමාත්‍යාංශය වෙත පැමිණ මුදලින් ද ගෙවිය හැකි බව කරුණාවෙන් සලකන්න.

**උපදෙස්**

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ සමීක්ෂණ සඳහා ඉදිරිපත් කෙරෙන පොත් භාර ගැනීමේ දී අනුගමනය කරනු ලබන පටිපාටිය

- ඉදිරිපත් කරනු ලබන පොත් පිළිබඳ අයදුම්පත්‍රය ලේඛකයා විසින් අත්සන් කළ යුතු ය. අදාල පොතේ අයිතිය ප්‍රකාශයට පවරා තිබේ නම් ප්‍රකාශකට ද අත්සන් කළ හැකිය.
- ළමා පොතක් අවම පිටු 16 කින් යුක්ත විය යුතුය. සාමාන්‍ය පොතක් පිටු 49 ට නොඅඩු විය යුතුය. (යුනෙස්කෝ ප්‍රමිතියට අනුව)
- පරිවර්තනයක් නම්,
  - මුල් කෘතියේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
  - පරිවර්තනය කිරීම සඳහා ලැබු ලිඛිත අනුමැතියේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- කුමන භාෂාවක් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) වුව ද ව්‍යාකරණ දෝෂ නොමැති විය යුතුය. භාෂාව නිවැරදි විය යුතුය. එසේ නොමැති වුවහොත් බලපත්‍රය ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අත්පිටපත්හි සෝදුපත් බලා ඇති බවට සහතික විය යුතුය.
- සමීක්ෂණ වාර්තා කතුවරයන්ට ලබා නොදේ. එසේ වුවද සංශෝධන සහිතව බලපත්‍රය ලබා දීමට තීරණය කරනු ලබන පොත් සඳහා යෝජිත සංශෝධන කවරේද යන්න සමීක්ෂණ වාර්තා අනුව දක්වනු ලැබේ.
- සමීක්ෂකයන්ගේ නම් හෙළිදරව් නොකෙරෙයි.
- බලපත්‍රය ලබාදීමට ප්‍රතික්ෂේප කරනු ලබන පොත් සම්බන්ධයෙන් අභියාචනා භාර නොගැනේ.
- බලපත්‍රය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන සියලුම අත්පිටපත් පරිගණකගත කොට පොතක් ලෙස සම්පූර්ණ කර (පිට කවරයද සහිතව) ඉදිරිපත් කළ යුතුය.
- අත් අකුරින් ලියන ලද අත් පිටපත් බලපත්‍රය ලබා දීම සඳහා පිළිගනු නොලැබේ.
- ඉදිරිපත් කරනු ලබන පොත් සම්බන්ධව තීරණය ට ගත වන කාලය -
  **සාමාන්‍යයෙන් පොතකට බලපත්‍රය ලබාදීම සඳහා මාස 2 ½ - 3 දක්වා කාලයක් ගතවන බව විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය.**

**වැදගත්**

- **වයස අවුරුදු 18 ට අඩු ළමුන් විසින් ලියන ලද පොත්**
- **අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පාසල් විෂය නිර්දේශයන්ට අනුකූලව පළ කරනු ලබන පොත්වලට සමාන්තර ලෙස ලියන ලද පොත්**
- **ප්‍රශ්නෝත්තර පොත් (5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය / අ.පො.ස (සා.පෙළ) / අ.පො.ස (උ.පෙළ))**
- **වැඩ පොත් (ප්‍රාථමික අංශය සහ වෙනත් )**
- **පින්තූර ශබ්ද කෝෂ (Picture Dictionary)**

**පාසල් පුස්තකාල බලපත්‍රය ලබා දීම සඳහා බාර ගනු නොලැබේ.**

**ඉහත කරුණු සම්පූර්ණ කර,**

- නිසි ප්‍රමිතියෙන් යුතු මුද්‍රිත පොත් හෝ මුද්‍රණයට අපේක්ෂිත අත් පිටපත් සමීක්ෂණය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකි ය. මුද්‍රණයට අපේක්ෂිත අත් පිටපත් ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය වේ.

**ලේකම්**

0112784839

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය